ශීර්ෂය 12- ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව

-----------------------------------------------

## 1. මූල්‍ය ප්‍රකාශන

----------------

### 1.1 තත්ත්වාගණනය කළ මතය

----------------------------

ජාතික අධ්‍යාපන කොමිෂන් සභාවේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව ජාතික අධ්‍යාපන කොමිෂන් සභාවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2020 මැයි 29 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව කොමිෂන් සභාව වෙත අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2020 නොවැම්බර් 20 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, 2019 දෙසැම්බර් 03 දිනැති අංක 271/2019 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව පිළියෙල කළ එම මූල්‍ය ප්‍රකාශනවලින් 2019 දෙසැම්බර් 31 දිනට ජාතික අධ්‍යාපන කොමිෂන් සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

----------------------------------------------

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම

-------------------------------------------------------------------------------------

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව කොමිෂන් සභාව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව කොමිෂන් සභාවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ

නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක අවප්‍රකාශයන්ගෙන් තොර බවට තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇති විය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇති වීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ දූස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වංචාවක් ඇතිවීමට හේතුවන බැවිනි.

- කොමිෂන් සභාවේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවූවද , අවස්ථාවෝචිත උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳ අවබෝධයක් ලබා ගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිත භාවය , ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කලමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව හෙළිදරව් කිරීම් ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනයෙන් හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය හා 38 වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 ප්‍රධාන ගණන්දීමේ නිලධාරී විසින් සිදු කළ යුතු සහතිකවීම්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | කොමිෂන් සභාවේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව ජාතික අධ්‍යාපන කොමිෂන් සභාවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිතාවය පිළිබඳව කලින් කල සමාලෝචනය සිදු කර ඒ අනුව පද්ධති ඵලදායි ලෙස කර ගෙන යෑමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතු බවත්, එම සමාලෝචනයන් ලිඛිතව සිදු කර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණත්, එවැනි සමාලෝචනයන් සිදු කළ බවට ප්‍රකාශ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. | සඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වාගෙන යාම සඳහා සභාපතිවරයා විසින් මාසික ප්‍රගති සමාලෝචන රැස්වීම් පවත්වන ලදී. එහිදී ලබා ගන්නා ලද තීරණ සම්බන්ධයෙන් විගණකාධිපතිවරයා දැනුවත් කිරීමට කටයුතු කර නැති බවත්, 2020 වසරේ සිට මේ සම්බන්ධයෙන් අවධානය යොමු කර අවශ්‍ය පියවර ගන්නා බව |

### 1.6.2 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම.

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | | | |
|---|---|---|---|
| නීති,රීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| (අ) 1991 අංක 19 දරන ජාතික අධ්‍යාපන කොමිෂන් සභා පනත | | | |
| (i) 3(2) වගන්තිය | කොමිෂන් සභාව අවිච්ඡින්න පැවැත්මක් සහිත සංස්ථාවක් බවට ප්‍රකාශ කර තිබුණද වියදම් සඳහා ප්‍රතිපාදන වෙන් කිරීම හා නිවාඩු හා වියදම් දැරීම, දුම්රිය බලපත්‍ර නිකුත් කිරීම්, ආදී විධිවිධාන | පනත ප්‍රකාරව කටයුතු කළ යුතු වීම | භාණ්ඩාගාරය විසින් ජාතික අධ්‍යාපන කොමිෂන් සභාවේ ගිණුම් කටයුතු සම්බන්ධයෙන් 1991 වර්ෂයේ සිට B ශ්‍රේණියේ |

| | | | |
|---|---|---|---|
| | රජයේ දෙපාර්තමේන්තු ස්වභාවයක් ගෙන තිබුණි. | | දෙපාර්තමේන්තුවක් ලෙසද 2017 නොවැම්බර් 14 දින සිට A ශ්‍රේණියේ දෙපාර්තමේන්තුවක් ලෙසද සලකා කටයුතු කරනු ලබන බව. |
| (ii)10(1)(ඊ) වගන්තිය | පනතේ විධිවිධාන ප්‍රකාරව දත්ත බැංකුවක් ස්ථාපිත කිරීමට සමාලෝචිත වර්ෂය දක්වා කටයුතු කර නොතිබුණි. | පනත ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. | එකග වෙමි. 2020 – 2025 පස් අවුරුදු සැලැස්ම තුළ ඇතුළත් කර ඇත. |
| (iii)20 වන වගන්තිය | කොමිෂන් සභා නිර්දේශ ඇතුළත් වාර්තාවක් වාර්ෂිකව ජනාධිපතිවරයා වෙත ඉදිරිපත් කර නොතිබුණි. | පනත ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. | පනතේ 20 වන වගන්තිය ප්‍රකාරව වාර්තාවක් අතිගරු ජනාධිපතිතුමා වෙත ඉදිරිපත් කිරීමට මෙතෙක් කටයුතු කර නොමැති අතර, ඉදිරියේදී ඒ සඳහා අවශ්‍ය පියවර ගනිමි. |
| (ආ)ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය මුදල් රෙගුලාසි 756 | සමාලෝචිත වර්ෂය අවසානයට රු. 44,974,918 ක් වූ වත්කම් සම්බන්ධයෙන් සමීක්ෂණයක් සිදු කර අදාළ වාර්තා 2020 සැප්තැම්බර් 23 දින වන විටත් විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. | භාණ්ඩ සමීක්ෂණය අවසන් කර ඇත. කොවිඩ් 19 වෛරස ව්‍යාප්තිය හේතුවෙන් නිශ්කාර්ය වත්කම් අපහරණ කටයුතු සිදු කිරීමට නොහැකි විය. අදාළ කටයුතු දැනට සිදු කරමින් පවතී. |

## 2 මූල්‍ය සමාලෝචනය

### 2.1 වියදම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | මුදල් රෙගුලාසි 50(ii) හා (iii) ඡේද අනුව නිවැරදිව සහ සකසුරුවම්කම් ලෙස ඇස්තමේන්තු පිළියෙල නොකිරීම හේතුවෙන් මුළු ඇස්තමේන්තුවේ රු5,385,382 ක ප්‍රතිපාදන ඉතිරිවීමක් නිරීක්ෂණය විය. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. | මුදල් අරපරිස්සමින් වියදම් කිරීම සම්බන්ධ 2019 වසර තුළ නිකුත් කරන ලද අයවැය චක්‍රලේඛ උපදෙස් අනුව සියළු වියදම් පාලනයකින් යුතුව දැරීම, චක්‍රලේඛ නිකුත් කරන අවස්ථාවේ අරඹා නොතිබූ ප්‍රසම්පාදන කටයුතු උපදෙස් පරිදි ක්‍රියාත්මක නොකිරීම, පූර්ව පාසල් අධ්‍යාපනය සහ පාසල් පාදක වෘත්තීය මාර්ගෝපදේශන ජාතික ප්‍රතිපත්ති සකස් කිරීම වෙනුවෙන් යුනිසෙෆ් ආයතනයෙන් හා බ්‍රිතාන්‍ය කවුන්සිලයෙන් ලද අනුග්‍රහ දායකත්වය හේතුවෙන් ඒ සඳහා වියදම් කිරීමට නියමිතව තිබූ මුදල් ඉතිරි වීම මීට හේතු විය. |
| (ආ) | ප්‍රාග්ධන වැය විෂයයන් දෙකක අනිවාර්ය ඉතිරිකිරීම් ඉක්මවා පිළිවෙලින් රු.25,775 ක් හා රු.86,658 ක වියදම් දරා තිබුණි. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. | -එම- |

### 2.2 බැරකම් හා බැදීම්වලට එළඹීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| පුනරාවර්තන වැය විෂයයන් **3** කට අදාලව ශුද්ධ ප්‍රතිපාදන ඉක්මවා එකගවී තිබූ බැරකම් වටිනාකම රු.770,404 ක් විය. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. | ජාතික අධ්‍යාපන කොමිෂන් සභාවේ රාජකාරී කටයුතු වෙනුවෙන් කණිෂ්ඨ කාර්යමණ්ඩලය සඳහා ගෙවීමට සිදුවූ අතිකාල වියදම් සඳහා මහා භාණ්ඩාගාරයේ අනුමැතිය අනුව ලබාගත් අතිරේක ප්‍රතිපාදන භාවිතා කර ඇත. |

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 දැක්ම හා මෙහෙවර

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- | --- |
| (අ) | කොමිෂම විසින් 1992 වර්ෂයේ ඉදිරිපත් කළ අධ්‍යාපන ප්‍රතිපත්තිය සඳහා යෝජනාවලිය පදනම්කර ගෙන 1997 වර්ෂයේදී ජනාධිපතිවරයා විසින් අධ්‍යාපන ප්‍රතිපත්තියක් ප්‍රකාශයට පත්කර තිබුණි. කෙසේ වුවද ඉන් පසු ඉදිරිපත් කරන ලද අධ්‍යාපන ප්‍රතිපත්තිය සඳහා යෝජනාවලින් ප්‍රතිපත්ති ලෙස ප්‍රකාශයට පත් කිරීමට කටයුතු කර නොතිබුණි. | පනතේ 2(1) සහ 2(3) වන වගන්ති ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. | 1991 අංක 19 දරන ජාතික අධ්‍යාපන කොමිෂන් සභා පනතේ 2(1) වගන්තිය අනුව අධ්‍යාපන ප්‍රතිපත්තිය ප්‍රකාශයට පත් කිරීම ජනාධිපතිවරයා විසින් සිදු කරනු ලබයි. |
| (ආ) | තරුණයන් පිළිබඳ ජනාධිපති කොමිෂන් සභා වාර්තාවේ 4 වන පරිච්ඡේදයේ සඳහන් නිර්දේශයන් ප්‍රකාරව පිහිටුවන ලද ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව විසින් ජාතික අධ්‍යාපන ප්‍රතිපත්තිය පිළිබඳ දස අවුරුදු සැලැස්මක් පිළියෙල කලයුතු වුවද එම සැලැස්ම සකස්කර නොතිබුණි. | ජාතික අධ්‍යාපන ප්‍රතිපත්තිය ගොඩනැංවීම සහ ප්‍රකාශයට පත් කිරීම සඳහා සුදුසු කාලරාමුවක් ගොඩනහා ගත යුතු වීම. | එකඟ වෙමි. කොමිෂන් සභාවක කාල සීමාව වසර 05 කි. එසේ පත්වන කොමිෂන් සභා විසින් පිළියෙල කරනු ලබන ප්‍රතිපත්ති ප්‍රකාශ වරින් වර ජනාධිපතිවරයා වෙත ඉදිරිපත් කරනු ලැබේ. දැනට ඉහත පැහැදිලි කරන ලද පරිදි ජාතික අධ්‍යාපන ප්‍රතිපත්ති සම්පාදන කාර්යයේ නියුතු ව සිටී. |

3.2 අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- | --- |
| (අ) | ජාතික වෘත්තීය සුදුසුකම් 5 සහ 6 මට්ටම් යටතේ ඩිප්ලෝමාධාරීන් රාජ්‍ය හා පෞද්ගලික අංශය යටතේ රැකියා ගත කිරීම් සම්බන්ධයෙන් පර්යේෂණ වාර්තාවක් සැකසීම සඳහා රු. 400,000 ක් ප්‍රතිපාදනය කර තිබූ නමුත් අවසන් පර්යේෂණ වාර්තාව නිකුත් කර නොතිබුණි. | සැලසුම් පරිදි කටයුතු කළ යුතු වීම | කාර්ය මණ්ඩල හිඟය හේතුවෙන් පමා කරන ලද මෙම කාර්ය 2020 වසරේ ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත් කර ක්‍රියාත්මක කිරීම ආරම්භ කර ඇත. |

| | | | |
|---|---|---|---|
| (ආ) | සාමාන්‍ය අධ්‍යාපනය පිළිබඳව ජාතික ප්‍රතිපත්තිය නැවත ඇගයීම සඳහා රු.1,800,000 ක ප්‍රතිපාදන පැවතියද පාසල් පද්ධතියේ ව්‍යුහය සහ විශේෂ සහ අවිධිමත් අධ්‍යාපනය පිළිබඳ නැවත ඇගයීම සඳහා නිර්දේශ සංවර්ධනය කිරීම සිදුකර නොතිබුණි. | -එම- | එකඟ වෙමි. කාර්ය මණ්ඩල ඌණතාව හේතුවෙන් මෙම කාර්යය අවසන් කර නොමැති වුවත්, නව බඳවාගැනීම් වලින් පසු මෙම කාර්යය අවසන් කිරීමට සැලසුම් කර ඇත. |
| (ඇ) | 13 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය යටතේ අධ්‍යාපනය සම්බන්ධ බලය පළාත් සභාවලට විමධ්‍යගත කිරීම පිළිබඳව වූ කාර්යයන් 24 ක් සම්බන්ධයෙන් නැවත අධ්‍යයනය සඳහා රු. 1,500,000 ක් ප්‍රතිපාදනය කර තිබූ අතර එහි මූල්‍ය ප්‍රගතිය සියයට 8.7 ක් පමණක් විය. | -එම- | මූලික අධ්‍යාපනයක් සිදුකර ඇති අතර, සුදුසු විශේෂඥ සම්පත් දායකයෙකු සොයා ගැනීමට අපොහොසත් වීම නිසා මෙම අධ්‍යයනය තාවකාලිකව අත්හිටුවන ලද අතර, කෙසේ වෙතත් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අදාළ කාරණයක් බැවින් මේ සම්බන්ධව ඉදිරි කටයුතු නොකර සිටීමට නව කොමිෂන් සභාව තීරණය කරන ලදී. |

**4 තිරසර සංවර්ධන අරමුණු ලඟා කර ගැනීම.**

| **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** |
|---|---|---|
| තිරසර සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ වසර 2030 “න්‍යාය පත්‍රය” පිළිබඳව ආයතනය විසින් දැනුවත් වී තිබුණ ද ආයතනයට අදාළ කර ගත හැකි තිරසර සංවර්ධන, ඉලක්ක හා අරමුණු ද එම ඉලක්ක කරා ළඟා විය යුතු සන්ධිස්ථානයන් ද ඉලක්ක මත ළඟාවීම් මැන බැලීම සඳහා වන දර්ශකයන් ද හඳුනා ගැනීමට කටයුතු කර නොතිබුණි. | තිරසර සංවර්ධන, ඉලක්ක හා අරමුණු ද එම ඉලක්ක කරා ළඟා වියයුතු සන්ධිස්ථානයන් ද ඉලක්ක මත ළඟාවීම් මැන බැලීම සඳහා වන දර්ශකයන් ද හඳුනා ගැනීමට කටයුතු කළ යුතු වීම. | මේ වන විටත්, අධ්‍යාපන ප්‍රතිපත්ති සම්පාදන කාර්යයන්හි දී මෙම තිරසර ඉලක්ක හා අරමුණු සැලකිල්ලට ගෙන තිබේ. ඉදිරියේදී, ඒ බව අදාළ වාර්තාවල නිශ්චිතව සඳහන් කිරීමට පියවර ගැනීමට උපදෙස් දී ඇත. |

## 5. මානව සම්පත් කළමනාකරණය

### 5.1 අනුයුක්ත කාර්ය මණ්ඩලය, තථ්‍ය කාර්ය මණ්ඩලය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- | --- |
| (අ) | ගණකාධිකාරි තනතුරට ස්ථිර පදනමින් නිළධාරියෙකු බඳවා නොගෙන අධ්‍යාපන අමාත්‍යාංශයේ ගණකාධිකාරි (අභ්‍යන්තර විගණක) වැඩබැලීමේ පදනම යටතේ පත්කර තිබුණි. | ගණකාධිකාරි තනතුර සඳහා ස්ථිර නිලධාරියෙකු පත්කර ගත යුතු වීම. | පුරප්පාඩු පිරවීම සඳහා වන කාර්යයයෙහි මුල් අවධිය මේ වන විට ආරම්භ කර ඇති අතර, ගණකාධිකාරී තනතුර සඳහා බඳවා ගැනීම දෙවන අදියරයෙහි දී ඉටු කර ගැනීමට සැලසුම් කර ඇත. |
| (ආ) | අනුමත ජ්‍යෙෂ්ඨ ප්‍රතිපත්ති පර්යේෂණ නිලධාරී තනතුරු දෙක ඇතුළුව තනතුරු 8 ක පුරප්පාඩු 17 ක් පැවතුණි. | අත්‍යාවශ්‍ය පුරප්පාඩු සම්පූර්ණ කිරීම හෝ පවතින තනතුරු නැවත සමාලෝචනය කළ යුතු වීම. | බඳවා ගැනීම් කටයුතු ආරම්භ කර ඇත. |